සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Provincial Department of Education - NWP**

**8 ශ්‍රේණිය** | පළමු වාර පරීක්ෂණය - 2019 | **16 S**

## ඉස්ලාම් ධර්මය

නම ...............................................

**කාලය පැය දෙකයි**

උපදෙස් : ★ **ප්‍රශ්ණ සියල්ලටම පිළිතුරු සපයන්න.**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. තව්හීදයට එරෙහි සෑම විශ්වාසයකම හැඳින්වෙන්නේ කෙසේ ද?
    1. ෂිර්ක් 2. මආද් 3. ඉබාදත් 4. රිසාලත්

02. පස්වේල් සලාතයන්වල අනිවාර්යයෙන් ම පාරායන කළ යුතු සූරාව කුමක් ද?
    1. සූරා අලක් 2. සූරා ඉක්ලාස් 3. සූරා කද්ර් 4. සූරා ෆාතිහා

03. තව්රාද් නම් ආගමික කෘතිය ලබා දෙන ලද නබිවරයාණන් කවු ද?
    1. ඊසා (අලෛ) 2. මූසා (අලෛ) 3. දාවූද් (අලෛ) 4. මුහම්මද් (සල්)

04. යළි නැගිටවනවායි යන අර්ථයෙන් පරලොව ජීවිතය හැඳින්වෙන නාමය කුමක් ද?
    1. රිසාලත් 2. සිෆාත් 3. මආද් 4. තව්හීද්

05. ගල් වැසි ඇති වීමෙන් විනාශයට පත් වූ ජන සමාජය කවුරුන් ද?
    1. නබි ලූත් (අලෛ) තුමාණන්ගේ සමාජය 2. නබි සාලිහ් (අලෛ) තුමාණන්ගේ සමාජය
    3. නබි නූහ් (අලෛ) තුමාණන්ගේ සමාජය 4. නබි හූද් (අලෛ) තුමාණන්ගේ සමාජය

- **පහත සඳහන් කරුණු නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද සලකුණු කරන්න.**

06. මවක් සතු තමාගේ දරුවන් කෙරෙහි තිබෙන්නා වූ ආදරයට වඩා අල්ලාහ් තමාගේ දාසයන් ආදරය කරයි. (.............)
07. ඉද්රීස් (අලෛ) තුමාණන් හට ලබා දෙන ලද සුහුෆ්හි සංඛ්‍යාව 50 කි. (.............)
08. අල්ලාහ්ට තුති පුදකිරීම සඳහා ඉටුකරන සජ්දාව "සජ්දා සහ්වු" නමින් හැඳින්වේ. (.............)
09. රමළාන් මාසය ඉස්ලාමික දින දර්ශනය අනුව 9 වන මාසයයි. (.............)
10. "ප්‍රාර්ථනාවන් මුඋමින්වරයෙකුගේ ආයුධයක් යනු අල්කුර්ආනයේ වැකියකි. (.............)

- **පහත සඳහන් කරුණු නිවැරදිව ගළපන්න.**

| | | |
|---|---|---|
| 11. | දුආ | ආදම් (අලෛ) |
| 12. | සබබ් | විත්ර් |
| 13. | කණ්ඩායම් වශයෙන් ඉටුකිරීම | තරාවීහ් |
| 14. | යම් දවසක අවසන් සලාතය | ප්‍රාර්ථනාව |
| 15. | අබුල් බෂර් | නියමයන් |

- **පහත සඳහන් කරුණුවලින් නිවැරදි උත්තරය සොයා හිස්තැන් පුරවන්න.**

(6666, 114, මුසා (අලෛ), ඊසා (අලෛ), උලුල් අස්මි, ආශ්චර්යය, නබි (සල්)තුමා, ආදම් (අලෛ)

16. මුසා (අලෛ) තුමාණන් ...................................... නබිවරුන්ගෙන් කෙනෙක් වේ.

17. මුඃජිසා යනු .................................. අර්ථය වේ.

18. කාත්තමුන් නබිය්යීන් යනුවෙන් හැඳින්වූයේ ...................................... තුමාණන්ය.

19. "රූහුල්ලාහ්" යනු .............................................. අයගේ විශේෂිත නාමයකි.

20. අල්කුර්ආනයේ ...................................................... වාක්‍යයන් තිබේ. (ලකුණු 2 x 20 = 40)

---

## II - කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. කෙටි පිළිතුරු සපයන්න.

1. ඊමානයේ මූලික විශ්වාසයන් දෙකක් සඳහන් කරන්න.
2. අල්ලාහ්ගේ කරුණාව පෙන්නුම් කරන විශේෂිත නම් දෙකක් සඳහන් කරන්න.
3. අල්ලාහ්ගේ දායාදයන් නිඃමත් දෙකක් නම් කරන්න.
4. සකාත් යන වචනයේ තේරුම් දෙකක් ලියන්න.
5. ඉෆ්තිරාෂ්, තවර්රුක් යනු විස්තර කරන්න.
6. රසුල්වරුන් දෙදෙනෙකුගේ නම් හා ඔවුනට ලබා දෙන ලද ආගම් කෘති සඳහන් කරන්න.
7. සලාතයේ ෆර්ල් ඉසිලීම් දෙකක් සඳහන් කරන්න.
8. සජ්දාවල කොටස් කීයද? එයින් දෙකක් නම් කරන්න.

(ලකුණු 2 x 8 = 16)

02. i. අල්කුර්ආනයේ සුවිශේෂී ගුණාංගයන් තුනක් ලියන්න.
ii. නබිවරුන් හතර දෙනෙක් සඳහන් කර, ඔවුහු ලබාගත් මුඃජිසාත් ද සඳහන් කරන්න.
iii. සලාතයේ පරලොව ප්‍රයෝජන හතරක් සඳහන් කරන්න. (ලකුණු 3+4+4 = 11)

03. i. සලාතයේ පාරායන කළ යුතු සුන්නත් දුආවන් තුනක් සඳහන් කරන්න.
ii. ෆර්ලු අයින් යනු කුමක් ද? උදාහරණ තුනක් සඳහන් කරන්න.
iii. සජ්දා සුක්ර් ඉටු කරන අවස්ථා හතරක් නම් කරන්න. (ලකුණු 3+4+4 = 11)

04. i. රමධාන් මාසයේ පිළිපැදිය යුතු යහපත් ක්‍රියාවන් තුනක් නම් කරන්න.
ii. රමධාන් උපවාසයේ ලැබෙන ප්‍රයෝජන 04 ක් නම් කරන්න.
iii. සකාත් හා සදකාව අතරේ තිබෙන වෙනස්කම් 04 ක් සඳහන් කරන්න. (ලකුණු 3+4+4 = 11)

05. i. දුආ ප්‍රාර්ථනාවක ක්‍රමවේද 03 ක් සඳහන් කරන්න.
ii. දුආ ප්‍රාර්ථනාව සඳහා ඉතා සුළු අවස්ථාවන් සඳහන් කරන්න.
iii. දුආ ප්‍රාර්ථනාව පිළිබඳ හදීසයක් සඳහන් කරන්න. (ලකුණු 3+4+4 = 11)

06. i. උලුල් අස්මි යනුවෙන් හඳුන්වන නබිවරුන් තිදෙනෙක් නම් කරන්න.
ii. අල්ලාහ්ගෙන් උපකාර පැතීමෙන් ලැබෙන ප්‍රයෝජන 04 ක් සඳහන් කරන්න.
iii. දිනපතා ඉටුකරන සුන්නත් සලාතයන් 04 ක් සඳහන් කරන්න (ලකුණු 3+4+4 = 11)

**8 ශ්‍රේණිය**

# පළමු වාර පරීක්ෂණය - 2019
## ඉස්ලාම් ධර්මය (පිළිතුරු පත්‍රය)

### I - කොටස

01. ෂිර්ක් 02. සූරාෆාතිහා 03. මූසා (අලෛ) 04. මආද් 05. ලූත් නබිතුමාගේ සමාජය 06. ✓ 07. ×
08. × 09. ✓ 10. × 11. ප්‍රාර්ථනාව 12. නියමයන් 13. තරාවීහ් 14. විත්ර්
15. ආදම් (අලෛ) 16. උලුල් අස්ම් 17. ආශ්චර්ය 18. නබි මුහම්මද් (සල්) 19. ඊසා (අලෛ)
20. 6666 (ලකුණු 2 x 20 = 40)

### II - කොටස

01. 1. තව්හීද්, ඊසාලත්, මආද් 2. අර්රහ්මාන්, අර්රහීම් 3. සුළඟ, ජලය 4. සංවර්ධනය, පිරිසිදුකම, දියුණුව
5. ඉෆ්තිරාෂ් - පළමු අත්තහියියාත්හි වාඩි වීම /තවර්රුක් - දෙවන අත්තහියියාත්හි වාඩි වීම
6. ඊසා (අලෛ) - ඉන්ජීල්, දාවූද් (අලෛ) සබූර් 7. 1. සූරා ෆාතිහා 2. තක්බීර් තහ්රීමා
8. 3 1. සහ්වු 2. තිලාවත්

02. i. මුළුමනින්ම ආරක්ෂා කරන ලද ආගම් කෘතීන්ය / සැමට පොදු වේ / සම්පූර්ණ මග පෙන්වීම
ii. 1. මූසා (අලෛ) අතැති ලීය සර්පයෙක් වීම, අත් ආලෝකමත් වීම 2. දාවූද් (අලෛ) යකඩ සිනිඳු කරදීම 3. සුලෙයිමාන් (අලෛ) ජින්වරුන්, සුළඟ ආදිය යටත් කරදීම, සතුන්ගේ, භාෂාව තේරුම් ගැනීම 4. මුහම්මද් (සල්) අල්කුර්ආනය

03. i. 1. දුආඋල් ඉෆ්තිතාහ් 2. රුකූහිදි පාරායන කරන තස්බීහය 3. සුජූද්හි පාරායන කරන තස්බීහ්
ii. සෑම මුස්ලිම්වරයෙකුම අනිවාර්යයෙන් ඉටුකළ යුතු ක්‍රියාවන්, පස්වේල් සලාතයන් /ජුම්ආ සලාතය/ දෙවියන්ට භාර වූවායින් පසු ඉටුකරන සලාතය
iii. 1. සතුටුදායක පණිවිඩයක් ලැබූ විට 2. යම් කාර්යයක් ලිහිල් වූ විට 3. ආපදාවකින් මිදුණු විට
4. කල්ගිය රෝග සුවවූවායින් පසු (ගැළපෙන උත්තරයට ලකුණු ලබා දෙන්න.)

04. i. සව්මයේ යෙදීම /රාත්‍රී සලාතය / අල්කුර්ආනය පාරායන කිරීම / ඉඋතිකාෆ් සිටීම
ii. දේව භක්තිය ඇති කිරීම /ඉවසීම උගැන්වීම / ශාරීරික සෞඛ්‍ය ලැබීම / අකුසල් වලින් මිදීමේ හැගීම ඇති කිරීම
iii.

| සකාත් | සදකා |
|---|---|
| ෆර්ල් | සුන්නත් |
| යම් අයට පමණක් අනිවාර්යය | කැමති අය කළ හැක |
| යම් භාණ්ඩ පමණක් | සියලු භාණ්ඩ |
| කෙසේ ලබා දිය යුතුයි යන නීතිරීති තිබීම | කැමති ආකාරයෙන් සිදුකළ හැක. |

05. i. වුලු සමඟ ප්‍රාර්ථනා කිරීම / කිබ්ලාවට මුහුණ දීම / තුන් වතාවක් කිරීම
ii. රාත්‍රියක අවසන් කොටසෙහි / සිකුරාදා දිනයන් / රමධාන් මාසයේ / අරෆා දිනය
iii. කවුරු හෝ වේවා අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා නොකරන්නේ ද ඔහු කෙරෙහි අල්ලාහ් කෝපයට පත්වේවි - හදීස් -

06. i. මූසා (අලෛ) / ඊසා (අලෛ) / මුහම්මද් (සල්)
ii. අල්ලාහ් ගැළපෙන සබබ් දෙස යොමු කරයි. අල්ලාහ්ගේ ලඟා වීමත්, කැමැත්තත් ලැබේ. / අපගේ ගෞරවය ආරක්ෂා වේ / අල්ලාහ්ගෙන් අසන විට කුසල් ලැබේ
iii. තහජ්ජද් /විත්ර් / ලුහා / පස්වේල් සලාතයේ දී ආරම්භයෙන් හෝ පසුව ඉටුකරන සලාතයන්